# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

World Health Organization
Sri Lanka

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 39. දුම්රිය භාවිතය

කොවිඩ්-19 ට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් වර්තමාන තත්ත්වය යටතේ, ශාරීරික දුරස්ථභාවය පවත්වා ගැනීමට හැකිවන පරිදි දුම්රියවල ගමන් කරන මගීන්ගේ සංඛ්‍යාව අවම කළ යුතු අතර වෙනත් ආරක්ෂක පියවරයන් අනුගමනය කළ යුතුය.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**දුම්රිය ස්ථානාධිපතිවරුන් / එන්ජින් රියදුරන් / ප්‍රවේශ පත්‍ර පරීක්ෂකවරුන්**

- දුම්රිය මැදිරියක ඉඩ දී ඇති උපරිම සංඛ්‍යාව එහි ආසන ධාරිතාවෙන් අඩක් බව සහතික කළ යුතුය. එනම්, මැදිරියක ආසන 50 ක් තිබේ නම්, ඕනෑම වේලාවක ගමන් කළ හැක්කේ 25 දෙනෙකුට පමණි. මගීන් කිසිවෙකු දුම්රිය මැදිරි තුළ සිටගෙන නොසිටිය යුතුය. වෙනස් වන තත්වය අනුව එක් එක් වකවානුවට අවසර ලත් ප්‍රමාණය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දැනුම් දෙනු ලැබේ.
- මගීන් අතර මීටර් 1 ක දුරක් පවත්වා ගෙන යන බවට සහතික වන්න.
- දුම්රියේ සියලුම කවුළු විවෘතව පවතින බවට සහතික විය යුතුය.
- සියලුම මගීන් මුහුණු ආවරණ පැළඳ සිටින බවට සහතික විය යුතුය.
- සියලුම දුම්රිය ස්ථානවල අත් සේදීමේ පහසුකම් ඇති බවට සහතික වන්න.
- එන්ජින් රියදුරන්ට සහ ප්‍රවේශ පත්‍ර පරීක්ෂකවරුන්ට පුද්ගලිකව භාවිතා කිරීම සඳහා ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කාරකයක් ලබා දීම.
- හැකි නම්, සෑම මැදිරියකටම ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කාරකයක් සවි කරන්න.
- දවස අවසානයේ සියලුම දුම්රිය පිරිසිදු කර ඇති බවට සහතික වන්න.
- සෑම ගමනක් සඳහාම ගෙවීම වෙනුවට හැකි තරම් වාර ප්‍රවේශ පත්‍ර අන්තර්ජාලය හෝ ජංගම /දුරකථන ඔස්සේ කරන ගෙවීම් භාවිතය දිරිමත් කරන්න.
- දුම්රිය මැදිරි තුලට යාචකයන්ට හෝ වෙළෙඳුන්ට ඇතුල් වීමට ඉඩ නොදෙන්න.

**මගීන්**

- එකිනෙකාගෙන් මීටර් 1 ක දුරක් පවත්වා ගනිමින් දුම්රිය ස්ථානයේ පෝලිමේ සිටින්න.
- මුහුණු ආවරණයක් නිසි ලෙස පැළඳිය යුතුය.
- පහසුකම් තිබේ නම්, සබන් හා වතුරෙන් අත් සේදීම හෝ දුම්රියට ඇතුළු වීමට පෙර ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කාරකයක් යොදා දෑත් විෂබීජහරණය කිරීම.
- දුම්රිය තුළ මීටර් 1 ක දුරක් පවත්වා ගෙන යන බවට සහතික වන්න.
- ගෙනයන බෑග් සහ භාණ්ඩ අවම කිරීම.
- හැකිතාක් දුරට දුම්රිය තුලදී ජංගම දුරකථනය ස්පර්ශ නොකිරීමට උත්සාහ කරන්න.
- නිතර ස්පර්ශ වන පෘෂ්ඨයන් උදා. හැඬල, ආසන, දොරවල්, බාර් ආදිය අනවශ්‍ය ලෙස ස්පර්ශ නොකරන්න.
- අවම වශයෙන් තත්පර 20 ක් වත් සබන් හා වතුරෙන් දුම්රියේ ගමන් කිරීමෙන් පසු අත් සෝදන්න.
- ඔබට සුළු හෝ ශ්වසන රෝග ලක්ෂණ ඇත්නම් දුම්රිය භාවිතා කිරීමෙන් වළකින්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- ජනමාධ්‍ය.
- සියලුම දුම්රිය ස්ථානවල ශබ්ද විකාශන යන්ත්‍ර හරහා නිවේදනය කරන්න.
- ප්‍රදර්ශන තිර හරහා විකාශනය කර පෙන්වන්න.
- සංඥා භාවිතය.
- සියලුම මැදිරි වල ප්‍රධාන උපදෙස් ප්‍රදර්ශනය කරන්න.



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.